# ක්‍රිකට් උන්මාදය




1996 අර්ජුන රණතුංග එක් දින ක්‍රිකට් පිළිබඳ ලෝක කුසලාන රැගෙන ලාහෝර් නුවර සිට ශ්‍රී ලංකාවට පැමිණි විටත් ඒ රටේ පමණක් නොව මේ රටේද වාසය කරන ශ්‍රී ලාංකිකයෝද ප්‍රීති ප්‍රමෝදයෙන් පිරී ඝෝෂා කළහ.

ජේ ආර් ජයවර්ධන රාජකීය විද්‍යාලය වෙනුවෙන් ක්‍රිකට් ක්‍රීඩා කළා ද කියන එක මම නොදනිමි. එහෙත් ඔහු ක්‍රිකට් ගැන ඉතාමත් උනන්දුවෙන් ක්‍රියා කළ බව නම් කිව හැකිය. ශ්‍රී ලංකාව අත්කරගත් ප්‍රථම ටෙස්ට් ක්‍රිකට් ජයග්‍රහණය වෙන වෙන් එදා ඕවල් පිටියේ සිටි උතුමාණන්වහන්සේ රජයේ නිවාඩුවක් හිටි හැටියේ ප්‍රකාශ කිරීම නිසා හටගත් පටලැවිල්ල බොහෝ දෙනාට අමතකව ගොස් ය.

2014 දී ඊ ළඟ ලෝක කුසලානය ශ්‍රී ලංකාවට හිමිවූයේ අර්ට වඩා සිල්ලර තරග මාලාවකිනි. විස්සයි විස්සේ තරග පෙළක අවසානයේය. එයින් දිනුමේ හෝ ක-සලානයේ අගය අවතක්සේරු කළ යුතු නැත . ඒ දිනුම ලබා කුසලාන අතින් ගෙන ලසිත් මාලිංග පෙරටු කොටගත් ක්‍රීඩකයන් ලක්බිමට පය තබන මොහොතේ මිහි තලය කම්පා නොවුණා විතරය. සකල ශ්‍රී ලාංකික ජනතාවම විජයග්‍රහණයෙන් උද්දාමයට පත්ව ඒ වීරයන් වටා රොක් වන්නට වූහ.

තවත් කරුණක් මතක් කර දිය යුතුය. ප්‍රමාණයෙන් ටිකක් අඩු වුවද මේ දිනුම ලබා කුසලාන අරන් එන වේලාවේ ශ්‍රී ලංකා ජනාධිපති ධුරය උසුලන මහින්ද රාජපක්ෂ ජනපති තුමා ක්‍රිකට් ශූරයකු නොවුවත් ඔහු ජේ ආර් ට වඩා ඒ අතින් ආඩම්බර විය යුතු පසුබිමක්ද ඇත. රාජපක්ෂ නම හා පරපුර දේශපාලන කරලියේ නංවා තැබීමට මුල් පියවර තැබූ රුහුණේ සිංහයා නමින් ජනප්‍රියව සිටි ඩී එම් රාජපක්ෂ රාජකීය විද්‍යාලයේ ක්‍රිකට් ක්‍රීඩකයකු වූවා පමණක් නොවේ ඔහුගේ කණිටු පුත් ජෝජ් රාජපක්ෂද පියගේ අඩි පාරේ යමින් රාජකීය විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමට අයත්ව සිටි බව මතක් කර දිය යුතුය.

එහෙවු යුගයක අරිට වඩා ඉහළින් ජයපැන් බොන එක වරදක් නැත. වරද ඒ කාරිය හද්දා මගුලක් බවට පෙරළා ගැනීමයි.

ජයග්‍රාහී ක්‍රිකට් ක්‍රීඩකයන් කටුනායකදීත් කොළඹට එන අතර පාර දිගේත් හරසරින් පිළිගත් ශ්‍රී ලාංකික ජනතාව 2009 දී ත්‍රස්තවාදීන් පරාජය කළ විට පැවැත්වූ උත්සවයට සමාන සැණකෙළි පවත්වන්නට පටන් ගත්හ. ජනාධිපති තුමා හමු වී ආශිර්වාද ලබා ගැනීමට පාර්ලිමේන්තුවට පිවිස එහි දී මහජන නියෝජිතයන් විසින් පිළිගනු ලැබීම ප්‍රධාන අවස්ථා ලෙසින් ගත යුතුය.

මට පෙනෙනා එකම එක අඩුපාඩුව මේ ලෝක ශූරයන් තමන්ට ආශිර්වාද කිරීමේ මේ අවසරය මල්වත්තට තබා අස්ගිරියටවත් නොදීපු එකය. පුංචි නගර සභා ඡන්දයක් දිනුවත් මහනුවරට දිවගොස් දෑත් බැඳ මල්වත්තේ මහ නා හිමියන් බැහැ දැකීමට පුරුදු වූ උවසුවන්ගෙන් සමන්විත ශ්‍රී ලංකාද්වීපයේ ක්‍රිකට් ලෝක කුසලාන හිමි කර ගත් තරුණ පිරිස ඒ පැත්තට අරන් යන්නට ක්‍රිකට් බලධාරීන් නොහිතුවේ ඇයි?

ඉස්සර හැන්දෑවට කොටහේනේ රා තැබෑරුමට එන දුප්පත් කම්කරුවන් හා කසල ශෝධකයන් මට මතකය. දවස පුරා සහඩිය පෙරාගෙන උපයා ගත් මුදලින් හොඳ හරිය රා කඩයට පුද කරන්නේ විනෝදයට නොවේ. ඔවුන්ට ඇති එකම සැනසීම රා ටිකක් බී වෙරි වී හිතේ දුක පලවා හැරීම පමණක් නිසාය.

ක්‍රිකට් ලෝලී ශ්‍රී ලාංකිකයන් කා බී ප්‍රීති වන්නේ එබඳු සැනසීමක් පතා ගෙන නොවේ. ක්‍රිකට් ශ්‍රී ලාංකිකයාගේ අබින් බවට පත්ව ඇති නිසාය. ආගම මිනිසාගේ අබින් යයි කීවේ කාර්ල් මාක්ස් නමැති විප්ලවයේ පියා ය. පා පන්දු (ඔසී ක්‍රමයේ ෆුට්) ඕස්ට්‍රේලියානුවන්ගේ ආගම යයි අභිත ප්‍රකාශයක් කළේ දකුණු අප්‍රිකානු රදගුරු ඩෙස්මන්ඩ් ටුටූ ය.

ඒ අනුසාරයෙන් අපට කිව හැක්කේ ක්‍රිකට් ශ්‍රී ලාංකිකයන් මත් කරන අබිං බවට පත්ව ඇති බවය.

මීළඟ ප්‍රශ්නය අබින් පාවිච්චිය කරන්නේ මොන එකකටද කියන එකය. මට තේරෙන විදියට නම් එයත් අර රා කඩයට යන දුප්පතා කරනවාට වඩා නම්බුකාර ක්‍රමවේදයකි. එහෙම කියනකොටම කිපෙන උදවිය හිටිය හැකිය. ඒ නිසා මම මගේ කියමන ටිකක් පැහැදිලි කර දිය යුත්තෙමි.

වයිවාරන්න අරගල ගැටුම් සහිත මේ ධරණී තලය මත ප්‍රශ්න නොමැති රටක් නැති තරම්ය. එක් එක් රට තම තමන්ගේ ඥාන නුවණ හා සම්පත්ද යොදා ගෙන එන ප්‍රශ්න විසඳා ලීමට උත්සාහ කරන්නේය. ප්‍රශ්න අමතක කරවීමට මගක් ඇත්නම් එය අර වාගේ වෙහෙස වීමට වඩා පහසුය. ලාබ ය.

ශ්‍රී ලංකාව ඒ අතින් වාසනාවන්ත දිවයිනකි. දහසක් ගැටලු මැද්දේ වුවත් කා බී විනෝද වන්නට සුදුසු මොකක් හරි එකක් කොහේ හරි තිබිලා කඩා පාත් වෙනවාය.

ක්‍රිකට් දිනුමත් ඒ වාගේ එකක්ය.

**කව බොව සතුටු වෙව**



ADVICE ON LEGAL MATTERS

Business & Commercial Law
Sale & Purchase of Busines | Leases | Franchises
Conveyancing
Residential, Commercial & Rural
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions
Probate & Testamentary
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration
Family Law
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements
Migration Law
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY LAWYERS

Senanie Kurukularatne
Barrister & Solicitor
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
17 Glenview Rise Berwick VIC 3806 Australia

Tel +61 3 8786 9682
Fax +61 3 8786 9681
Mobile +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au